S/M

සියලු ම හිමිකම් ඇවිරිණි

විශාඛා විද්‍යාලය, කොළඹ 05

දෙවන වාර පරීක්ෂණය - 2018

ගණිතය

7 ශ්‍රේණිය

කාලය : පැය 2 යි

නම / අංකය : ..............................................................................................

I කොටස

❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

1) (i) මෙම සම චතුරස්‍රය රූපයේ ආකාරයට කොටස් දෙකකට වෙන් කළ විට ලැබෙන එක් ත්‍රිකෝණයක සමමිතික අක්ෂ ගණන කොපමණ ද?



(ii) මෙම සෘජුකෝණාස්‍රය රූපයේ ආකාරයට කොටස් දෙකකට වෙන් කළ විට ලැබෙන එක් ත්‍රිකෝණයක සමමිතික අක්ෂ ගණන කොපමණ ද?



2) පහත දී ඇති අවස්ථාවලින් කුලකයක් වන අවස්ථා යටින් ඉරක් අඳින්න. එම කුලකවල අවයව සඟල වරහන් තුළ ලියන්න.

(i) පන්තියේ බර ළමුන්

(ii) "රජරට" යන වචනයෙන් අකුරු

(iii) උස කඳු

පසුගිය ප්‍රශ්න පත්‍ර සඳහා
mathematica.lk

3) හිස් කොටුව සඳහා ගැළපෙන අගය ලියන්න.

$31 - 7 \times 12 \div \square = 3$

4) 53496 මෙම සංඛ්‍යාව 4 න් බෙදේ. මෙම සංඛ්‍යා 6 න් හා 9 න් බෙදේ ද? නොබෙදේද? යන්න හේතු සහිතව ලියන්න.

5) 210 හි සියලුම ප්‍රථමක සාධක සොයන්න.

6) $2^6 = 64$ වේ නම් හිස් කොටු සඳහා ගැළපෙන අගය ලියන්න.

(i) $4^{\square} = 64$ (ii) $\square^2 = 64$

7) (i) 21 වන සියවස අවසන් වන වර්ෂය ලියන්න.

(ii) එම වර්ෂය අයත් දශකය ලියන්න.

8) (i) සරල රේඛා යුගලයක් සමාන්තර වේද? නොවේද? යන්න පරීක්ෂා කිරීම සඳහා භාවිතා කරන උපකරණ දෙක නම් කරන්න.

(ii) සරල රේඛා දෙකක් අතර නොවෙනස්ව පවතින කෙටිම දුර හඳුන්වන විශේෂ නම ලියන්න.

Call us for Next Term Past Papers
0112 812 132

9) (i) හිස් කොටු සඳහා ගැළපෙන අගය ලියන්න.

(i) $\left(+\frac{7}{9}\right) + \square = \left(+\frac{2}{9}\right)$

(ii) $\square + = (-4.65) = (-12.65)$

10) (i) රූපයේ දැක්වෙන $A\hat{O}B$ බාහු නම් කරන්න.




(ii) රූපයේ දැකිය හැකි ඉහත කෝණය හැර වෙනත් ඕනෑම කෝණයක් නම් කරන්න.

11) $\frac{1}{8}, \frac{1}{14}, \frac{1}{12}, \frac{1}{7}$.

(i) ඉහත භාග හඳුන්වන විශේෂ නම ලියන්න.

(ii) $\frac{1}{7}$ ඒවා 5 ක් භාගයක් ලෙස ලියන්න.

12) (i) ගණක රාමුවේ දැක්වෙන දශම සංඛ්‍යාව ලියන්න.

(ii) එය කියවන අයුරු වචනයෙන් ලියන්න.




13) මිනිසෙකු ලොතරැයි දිනුමකින් ලද a නම් මුදලක් තම බිරිඳ, පුතා, දියණිය හා තමා අතර සමානව බෙදා ගන්නා ලදී. එක් අයෙකුට ලැබුණු මුදල වීජීය ප්‍රකාශනයකින් දක්වන්න.

14) 8mg × 12 ගුණ කල විට ලැබෙන පිළිතුර ග්‍රෑම්වලින් පමණක් ලියන්න.

15) (i) ඕනෑම උත්තල බහු අස්‍රයක් හා අවතල බහු අස්‍රයක් අඳින්න.

(ii) ඒවා වෙන් කර හඳුනා ගන්නා අයුරු ලියා දක්වන්න.

16) රූපයේ ලකුණු කර ඇති දත්ත අනුව පහත ත්‍රිකෝණ සඳහා වඩාත් ගැළපෙන නම පමණක් ලියන්න.




(i) ABC ත්‍රිකෝණය = .................

(ii) ACE ත්‍රිකෝණය = .................

(iii) ACD ත්‍රිකෝණය = .................

(iv) DEF ත්‍රිකෝණය = .................

17) පොල්ගෙඩියක මිල රුපියල් x වෙයි. එහි මිල රුපියල් 5 කින් වැඩි විය. එවිට පොල්ගෙඩියක මිල රුපියල් 85 ක් විය. මෙම තොරතුරු සමීකරණයකින් දක්වන්න.

18) සමද්විපාද ත්‍රිකෝණයක පරිමිතිය $P = 2a + b$ වේ. $a = 15cm$ ද, $b = 11cm$ ද නම් P සොයන්න.

19) O කේන්ද්‍රය වූ වෘත්තයේ $OP = 3.5cm$ වේ.




(i) AB දිග සොයන්න.

(ii) AB රේඛාව හඳුන්වන විශේෂ නම ලියන්න.

20) (i) රූපයේ දැක්වෙන ඝනකාභයේ පරිමාව වන v සඳහා සූත්‍රය ලියන්න.




(ii) එම බඳුනට 21 50ml න් දැමිය හැකි නම් එම දැමූ ද්‍රව පරිමාව මිලි ලීටර්වලින් පමණක් ලියන්න.

## II කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(1) පතුලේ දිග 1m ද, පරිමිතිය 296cm ද වන ඝනකාභ ජල ටැංකියක පතුල රූපයේ දැක්වේ.




පසුගිය ප්‍රශ්නපත්‍ර සඳහා
mathematica.lk

(i) පතුලේ පළල සොයන්න.

(ii) පතුලේ වර්ගඵලය සොයන්න.

(iii) එම පතුල සහිත ඝනකාභ ටැංකියේ උස $\frac{1}{2}$m වේ නම් එහි පරිමාව ඝන සෙන්ටිමීටර්වලින් සොයන්න.

(iv) එම ඝනකාභ ටැංකියට 41 800ml බැගින් ජලය අඩංගු භාජනයකින් 50 වාරයක් දැමූවිට සම්පූර්ණ ටැංකිය පිරුණි. ටැංකියේ ධාරිතාව සොයන්න.

(2) (a) (i) ළමුන් තිදෙනෙකුගේ උස පිළිවෙළින් 168cm, 1m, 57cm, 1.5m වේ. මෙම ළමුන් තිදෙනාගේ උසෙහි එකතුව සොයන්න.

(ii) කොළඹ සිට දඹුල්ලට දුර 140km කි. එම දුරෙන් 95km 275m ක් දුම්රියෙන් ගමන් කළේ නම් යාමට ඇති ඉතිරි දුර ප්‍රමාණය කොපමණ ද?

(b) සුළු කරන්න.

(i) 8m 9cm × 16 (ii) 19km 83m ÷ 8

(c) පාදයක දිග 7cm 5mm වන සමපාද ත්‍රිකෝණයක පරිමිතිය සොයන්න.

(3) (a) $9x - 13 = 41$ විසඳන්න.

(a) සුළු කරන්න

(i) $7a - 3a + a$ (ii) $9x - 3y + 5 - 7x - 2y - 9$

(c) රූපයේ දී ඇති ත්‍රිකෝණයේ a = 4cm ද, b = 6cm ද නම් එහි පරිමිතිය සොයන්න.




(4) (a) සුළු කරන්න.

(i) $1\frac{1}{2} + 1\frac{2}{3} + \frac{5}{6}$ (ii) $4\frac{3}{8} - 2\frac{5}{6}$

(b) සුළු කරන්න.

(i) $0.097 \times 38$ (ii) $7.588 \div 7$

පසුගිය ප්‍රශ්න පත්‍ර සඳහා
mathematica.lk

(5) (a) $36 = 2 \times 2 \times 3 \times 3$

$54 = 2 \times 3 \times 3 \times 3$

$90 = 2 \times 3 \times 3 \times 5$

ඉහත දී ඇති ගුණිත ඇසුරින් පමණක්

(i) 36, 54, 90 හි මහාම පොදු සාධකය සොයන්න.

(ii) 36, 54, 90 හි කුඩාම පොදු සාධකය සොයන්න.

(b) (i) 2003.11.20 දින උපන් මිලානිගේ වයස 2018.01.15 දිනට කොපමණ ද?

(ii) ඒ අනුව ඇයට නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ ඉහත දිනයට පෙර වයස ගණනය කරන්නේ නම් ඒ අනුව ඇයට සහභාගී විය හැකි කරග ඉසව්ව වන්නේ 15 න් පහළ ද? 17 න් පහළ ද? යන්න ලියා දක්වන්න.

(c) a = 2 හා b = 3 ආදේශයෙන් $5a^3 3b^2$ හි අගය සොයන්න.

(6) (a) හිස්තැන් සඳහා ගැළපෙන අගයන් ලියන්න.

(i) 1.05g = ........... mg

(ii) ........... kg = 75g

(iii) 6g 8mg = ............. mg

(b) (i) $100g - 20g\ 475mg$ අඩු කරන්න.

(ii) බිස්කට් එකක ස්කන්ධය 4g 875mg කි. එවැනි බිස්කට් 8 ක මුළු ස්කන්ධය සොයන්න.

(c) කෝණ මානය භාවිතයෙන් පහත දී ඇති කෝණ ඇඳ නම් කරන්න.

(i) $A\hat{B}C = 105^0$ (ii) $P\hat{Q}R = 305^0$

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**